# 多言語情報コーナー　　（令和６年　１月号）

## 1. ආදායම් බදු පිලිබඳව

ජපානයේ රැකියාවක් කර වැටුපක් ලබා ගන්නා පුද්ගලයන්ට රටට ආදායම් බදු නමින් බද්දක් ගෙවීමට සිදුවේ.
ඔබ ගෙවිය යුතු මුදල ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා වර්ෂය තුළ ඔබට ලැබෙන වැටුප අනුව තීරණය වේ.
සැම මසකම සමාගම ඔබේ වැටුපෙන් බදු අඩු කර ඔබ වෙනුවෙන් රජයට ගෙවනු ලැබේ. මෙම ගෙවීමේ ක්‍රමය රඳවා ගැනීමේ බද්ද ලෙස හැඳින්වේ.

සමාගම ජනවාරි සිට දෙසැම්බර් දක්වා අඩුකරගනු ලැබූ බදු වැඩිද අඩුද යන්න දෙසැම්බර් මාසයේදී ගණනය කරනු ලැබේ. මෙය වසර අවසාන ගැලපීම ලෙස හැඳින්වේ.
ඔබගේ වැටුපෙන් අඩුකරගනුලැබූ බද්ද වැඩි නම් සමාගම එය ඔබේ දෙසැම්බර් හෝ ජනවාරි වැටුපට එකතු කර ඔබට ආපසු ලබා දෙන්නෙමු.

ගෙවන බදු ප්‍රමාණය සැම මසකම ඔබට ඔබේ සමාගමෙන් ලැබෙන "වැටුප් පත්‍රිකාවේ" හෝ ඊළඟ වසරේ ජනවාරි 31 වනදා වන විට ඔබට ලැබෙන "රැකියා ආදායම වෙනුවෙන් රඳවා ගැනීමේ බදු පත්‍රිකාවේ" සටහන් කර ඇත.

සමාගම් දෙකකින් හෝ වැඩි ගණනකින් වැටුප් ලබන අය, තම වැටුපට අමතරව යෙන් 200,000ට වැඩි මුදලක් ලබන අය සහ තම සමාගම් බදු රඳවා නොගත් හෝ වසර අවසාන ගැලපුම් නොකරන අය ලේඛන තමන් විසින්ම ඉදිරිපත් කළ යුතුය. මෙය අවසාන බදු වාර්තාව ලෙස හැඳින්වේ.
අවසාන බදු වාර්තාව සැකසීම සඳහා ඔබ සේවය කළ වර්ෂයෙන් පසු වසරේ පෙබරවාරි 16 සහ මාර්තු 15 අතර කාලය තුල අවශ්‍ය ලේකන ආධායම් බදු කාර්යාල වෙත ඉදිරිපත් කලයුතු වේ.අදාල ගෙවීම් කොම්බිනි වෙළඳසැල් , බැංකු, තැපැල් කාර්යාල මගින් සිදුකරනු ලැබේ.
ජපානයෙන් තම මවු රටට යාමට බලාපොරොත්තු වන පුද්ගලයන් ජපානයෙන් පිටවීමට පෙර අවසාන බදු වාර්තාව සිදුකල යුතුය. වැඩි විස්තර සඳහා කරුණාකර බදු කාර්යාලයෙන් විමසන්න.

එසේම අඩු වැටුපක් ලබන බිරිඳක් හෝ ස්වාමිපුරුෂයෙක් සිටින පවුලේ අය, අවුරුදු 16 ට වැඩි දරුවන්, වයෝවෘද්ධ පියවරුන් සහ මව්වරුන්, ජීවිත රක්ෂණ, දිගු කාලීන වෛද්‍ය රක්ෂණ ආදී විවිධ රක්ෂණ ගෙවා ඇති අය නම් ඔබ ඔබගේ හෝ පවුලේ සාමාජිකයෙකුගේ අසනීප හෝ වෛද්‍ය වියදම් වනුවෙන් දෙසැම්බර් 31 දක්වා වසර තුළ යෙන් 100,000 ට වඩා ගෙවා ඇති නම් , සමාගම මගින් සිදුකර බදු

ගැලපීමේදී හෝ අවසාන බදු වාර්තාව සැකසීමේදී එම ගෙවීම් පිළිබඳ ලේකන ඉදිරිපත් කිරීමේදී නැවත එම මුදල් ලබාගැනීමේ හැකියාව පවතී.

## 2. තොච්ගි බදු කාර්යාලයෙ දැන්වීම පිලිබදව

2023 වසර සඳහා අවසාන බදු ගැලපීම සඳහා උපදේශන සහ බදු ගැලපීම පිළිබද අයදුම් කිරීම සඳහා සෙනසුරාදා දින, ඉරිදා දින සහ නිවාඩු දින හැර, 2024පෙබරවාරි 16 සිට මාර්තු 15 දක්වා සිදු කරනු ලැබේ.
ස්ථානය තොච්ගි, කතයනගි නගරයේ තොච්ගි වාණිජ හා කර්මාන්ත ශාලාව වේ.

අවසාන බදු ප්‍රකාශන ස්ථානයට ඇතුළු වීමට, ප්‍රවේශ පත්‍රයක් අවශ්‍ය වේ. ඇතුළත් වීමේ ප්‍රවේශපත්‍ර ලබා ගැනීම සඳහා, ජාතික බදු නියෝජිතායතනයේ LINE නිල ගිණුම භාවිතා කර LINE මිතුරෙකු ලෙස ලියාපදිංචි වීම මගින් ඔබට අංක සහිත ඇතුළත් වීමේ ප්‍රවේශ පත්‍රයක් කල්තියා ලබා ගත හැකිය, නැතහොත් එදින එම ස්ථානයේ දී බෙදා හරිනු ලබන ප්‍රවේශ පත්‍රයක් ලබා ගත හැක.

එසේම, ඔබට බදු වාර්තා ප්‍රකාශන කරන ස්ථානයට යාමට අවශ්‍යම නැත, ඔබට තවමත් ඔබේ ස්මාර්ට් ජංගම දුරකතනයෙන් හෝ පරිගණකයෙන් ජාතික බදු ඒජන්සියේ නිල වෙබ් ගිණුමේ අවසාන බදු වාර්තා අංශය මගින් e tax යටතේ සිදුකල හැක.

ඔබ ඥාතියෙකුට අනුග්‍රහය දක්වන්නේ නම්, එම පුද්ගලයාගේ මුළු ආදායම, ආදායම යෙන් 480,000 (මන් 48) ට වඩා අඩු වීම වැනි යම් යම් අවශ්‍යතා සපුරාලන්නේ නම්, ආදායම් බදු අඩු විය හැක.

ඔබ සහාය දක්වන ඥාතියා ජපානයේ ජීවත් නොවන්නකු නම් සහ ජපානයේ ලිපිනයක් නොමැති නම්, ඥාතිත්වය සනාථ කරන ලියකියවිලි, පවුල් ලේඛනයේ පිටපතක් යනාදිය සහ යැපෙන්නන් සඳහා මුදල් ගෙවීම් කල කාලය සහ ප්‍රමාණය පෙන්වන ලේඛන අමුණන්න. ඔබ ඔබේ අවසන් බදු වාර්තාවට මූල්‍ය ආයතනයකින් මුදල් ප්‍රේෂණය කල බවට ලේඛන ඉදිරිපත් කර එම  ලේඛන විදේශීය භාෂාවකින් නම් ජපන් භාෂාවට පරිවර්තනයක් කිරීම අවශ්‍ය වේ.

2023 සිට ඔබේ යැපෙන්නන් වයස අවුරුදු 30 ට වැඩි සහ වයස අවුරුදු 70 අතර නම් එම යැපෙන්නන් වෙනුවෙන් ඒ වසරට අදාලව ජීවන වියදම් හෝ අධ්‍යාපන වියදම් සඳහා ඔබ ඥාතියෙකුට යෙන් 380,000 (මන් 38) කට වඩා අඩු නම් ඔබට අදායම් බදු අඩු කිරීම් ලබා ගත නොහැක.

පෙබරවාරි 15 ට පෙර, බදු ප්‍රතිලාභ උපදේශන තොච්ගි බදු කාර්යාල ගොඩනැගිල්ලෙන් ලබා ගත හැකි අතර ඔබට කිසියම් අපැහැදිලි බවක් ඇත්නම්, කරුණාකර බදු කාර්යාලය අමතන්න.

### 3. දුම්කොළවල මගින් ඇතිවන සෞඛ්‍ය බලපෑම පිලිබඳව

දුම්කොළ දුමාරයේ ආසන්න වශයෙන් රසායනික ද්‍රව්‍ය වර්ග 5,300ක් පමණ අඩංගු වන අතර ඉන් 70ක් පමණ පිළිකා කාරක වේ. එමනිසා, දුම්පානය විවිධ රෝග ඇතිවීමට හේතුකාරක වේ.

සිගරට් වල අඩංගු ප්‍රධාන හානිකර ද්‍රව්‍ය තුන වන්නේ නිකොටින්, තාර සහ කාබන් මොනොක්සයිඩ් ය. නිකොටින් මගින් රුධිර වහනිවල ලේ ගමනා ගමනය අවහිර කිරීම මගින් හෘද රෝග සහ මොලයේ ඇති සිහින් රුධිර නාල පිපිරිම වැනි අවදානම් තත්වයන් ඇතිවීමේ අවදානම වැඩි කරයි.

ඔබ දුම්පානය කරන කාල සීමාව සහ පානය කරන දුම්වැටි ගණන වැඩි වන තරමට අවදානම වැඩි වන අතර ඔබ දුම්පානය නතර කරන විට අවදානම ක්‍රමයෙන් අඩු වේ.

ඔබ කුමන වයසක සිට දුම්පානය ආරම්භ කලත් ඔබ ප්‍රමාද නැත.
ඔබ හෝ ඔබේ ආදරණීයයන් වෙනුවෙන් දුම්පානය නතර කිරීමට පළමු පියවර ගැනීමට ඔබ කැමතිද?

### 4. වතරසේ උණුසුම් වායු බැලුන් පියාසර දිනය පිලිබඳව

වතරසේ උණුසුම් වායු බැලුන් දිනය යනු සෑම මසකම තුන්වන ඉරිදා පැවැත්වෙන උණුසුම් වායු බැලූන පියාසර කිරීමේ උත්සවයකි.
ඔබට උණුසුම් වායු බැලූනය කඹයකින් බිම ඇති බරකට සම්බන්ධ කළ හැකි අතර උණුසුම් වායු බැලූනය පොළවේ සිට මීටර් 20 සිට 30 දක්වා ඉහළට නැඟී පියාසර කිරීම අත්විඳිය හැකිය.

මෙම අවස්ථාවට සහභාගිවන්නන්ගෙන් බොහෝ ධනාත්මක ප්‍රතිචාර ලැබී ඇත, මන්ද එය උණුසුම් වායු බැලූන පියාසර කිරීමට ඇති උද්යෝගය පහසුවෙන් අත්විඳීමට ඉඩ සලසයි.

මීලගට පැවැත්වෙන දිනයන් සහ වේලාවන් වන්නේ ජනවාරි 21, පෙබරවාරි 18 සහ මාර්තු 17 යන දිනවල උදේ 7:00 සිට 10:00 දක්වා වේ. අප්‍රේල් මාසයේ සිට සෑම මසකම තුන්වන ඉරිදා දින පැවැත්වේ. ස්ථානය ජපානයේ විශාලතම ජලාශය වන වතරසේ ජලාශය ආසන්නයේ තිබෙන ෆුජිඔකා වතරසේ ක්‍රීඩා උද්‍යානයයි.
සෑම අවස්ථාවකදීම උපරිම වශයෙන් පුද්ගලයන් 200 ක් වන අතර පළමුව පැමිණෙන අයට පළමුව පියාසර කිරීමේ අවස්ථාව හිමි වේ.
අයදුම්පත් කල්තියා ඉදිරිපත් කළ යුතු අතර සෑම මසකම, වතරසේ උණුසුම් වායු බැලුන් දිනය සඳහා පමණක් අයදුම් පත්‍ර තොචිගි නගරයේ වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. අයදුම් කිරීමේ කාල සීමාව තුළ අයදුම් පත්‍රය භාවිතා කර අයදුම් කරන්න. ධාරිතාව ළඟා වූ වහාම එම දිනය අයදුම් කිරීමේ අවසාන දිනය වනු ඇත.

වයස අනුව අය මරණ මුදල වෙනස් වේ. අවුරුදු 1 සහ 2 අතර ළමුන් සඳහා ප්‍රවේශය නොමිලේ ද , අවුරුදු 3 සහ ප්‍රාථමික පාසල් වයසට අඩු ළමුන් සඳහා යෙන් 500 බැගින් ද , ප්‍රාථමික පාසල් සිසුන් සඳහා යෙන් 1,000 බැගින් සහ කනිෂ්ඨ සහ උසස් පාසල් සිසුන් සහ වැඩිහිටියන් සඳහා යෙන් 2,000 බැගින්ද අය කරනු ලැබේ.
ප්‍රාථමික පාසල් වයස දක්වා ළමුන් සහභාගී වීමේදී කරුණාකර කනිෂ්ඨ උසස් පාසල් වයසේ හෝ ඊට වැඩිහිටි භාරකරුවෙකු සමඟ පැමිණෙන්න.

වතරසේ උණුසුම් වායු බැලුන් සමඟින්, ඔබට ශ්‍රිතුව කුමක් වුවත් ප්‍රීතිමත් බැලුන් ගුවන් ගමනක් භුක්ති විඳිය හැකිය.
ඔබත් ගුවනේ සිට අලංකාරවත් දර්ශනය භුක්ති විඳීමට කැමතිද?